(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 2(6).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2016 මාර්තු මස 30 වැනි බදාදා**

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 175/'16

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු විමල් රාජපක්ෂ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු කනක හේරත් මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු සී. බී. රත්නායක මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍ය ගරු රවී කරුණානායක මහතාට එරෙහි විශ්වාස භංගත්වය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 148 වැනි ව්‍යවස්ථාවට අනුව, රජයේ මුදල් කටයුතු පිළිබඳව පූර්ණ බලය පාර්ලිමේන්තුව සතුවන බැවින් ද, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයෙහි ලා ප්‍රධානතම උපකරණය වන වාර්ෂික අයවැය ලේඛනය මෙම උත්තරීතර සභාවට ඉදිරිපත් වනවිට, ඉතා විස්තරාත්මකව, විනිවිද භාවයකින්, උපරිම විශ්වාසය රැකෙන පරිදි, සත්‍ය ලෙස ඉදිරිපත් කිරීම මුදල් අමාත්‍යවරයාගේ ප්‍රධානතම යුතුකම හා වගකීම වන්නේ නමුදු, 2016 අයවැය ලේඛනය සම්මත කිරීමේදී මුදල් අමාත්‍යවරයා, දුර්නිරූපණයක් තුළින් පාර්ලිමේන්තුව හා මහජනතාව නොමඟ යවා එකී අයවැය ලේඛනය හුදු ප්‍රලාපයක් බවට පත්කළ බැවින් ද;

රටෙහි සමස්ත නිමවුම, ආදායම්, සේවා නියුක්තිය, මිල මට්ටම්, ගෙවුම් ශේෂය, ඉතුරුම් හා ආයෝජන වැනි සාර්ව ආර්ථික විචල්‍යයන් කෙරෙහි බරපතල හානිකර බලපෑම් ඇතිකොට, සමස්ත ආර්ථිකයම මුළුමනින්ම විනාශය කරා ගෙන යමින්, හිතුවක්කාරී, අනම්‍ය හා අත්තනෝමතික රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කරන නිසාවෙන්ද;

ශ්‍රී ලංකා රුපියල දිගින් දිගටම අවප්‍රමාණය වෙමින් ආනයන උද්ධමනකාරී පීඩනයක් වර්ධනය වන අතර, රට සතු නිල විදේශ සංචිත ඉතා දරුණු ලෙස පහත වැටීමෙන්, ආර්ථිකය පමණට වඩා රත්වී, අවදානම් සහගත තත්ත්වයක් නිර්මාණය වී ඇති බැවින්ද;

ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීමේදී (ෆිච් රේටිං) ශ්‍රී ලංකාව B+ නියෝධාත්මක (සෘණ) තත්ත්වයකට ශ්‍රේණිගත වීමෙන්, ශ්‍රී ලංකාවට ණය ගෙවීමට ඇති හැකියාව පිළිබඳව අවදානම් තත්ත්වයකට රට ඇද දමා ඇති හෙයින්ද;

2016ක් වූ ජනවාරි 30 දින, දිනමිණ ජාතික පුවත්පතෙහි මුල් පිටුවෙහි මුල් පුවතින්, "ආණ්ඩුවේ මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ පැහැදීමක් - විදේශීය ආයෝජකයින් මෙරට බැංකුවල ඩොලර් බිලියන 1.2ක් තැන්පත් කරලා" යනුවෙන් මුදල් අමාත්‍යවරයාගේ ප්‍රකාශයක් ලොවපුරා ප්‍රචාරය කොට ඇති නමුදු දැවැන්ත විනිමය ප්‍රවාහයක් බැංකු තුළට ගලා නොආ බව මූල්‍ය හා බැංකු වෙළඳපොළ සඳහන් කරන බැවින් ද;

"මහින්දගේ ආණ්ඩුව ගත් තව කෝටි ලක්ෂයකට වැඩි ගණනක් ගිණුම්ගත වී නැති" බව මුදල් අමාත්‍යවරයා විශේෂ ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වා කරන ලද බරපතල ප්‍රකාශය මඟින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ විධිවිධාන, දැනුවත්ව හෝ නොදැනුවත්ව කඩ කොට ඇති බැවින් ද;

මුදල් අමාත්‍ය ගරු රවී කරුණානායක මහතා පිළිබඳ මෙම ගරු සභාවේ විශ්වාසනීයභාවය සම්පූර්ණයෙන්ම නොමැති බැවින්, තවදුරටත් මුදල් අමාත්‍යවරයා විසින් එම ධුරයේ කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසය භංග වී ඇති බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.